# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1817/65 - 2013 ජූලි මස 05 වැනි සිකුරාදා - 2013.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

වර්ෂ 2013 ක් වූ ජුනි මස 07 වැනි දින,
කොළඹ දී ය.

2013 අංක 1 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය

හැඳින්වීම.

1. මෙම විධානය 2013 අංක 1 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමකටම, මෙම විධානයෙහි දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ විය යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම්.

2. බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසිදු මුදල් සමාගමක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව ;

2.1 යම් පාලිත සමාගමක්, පාලිත සමාගමක පාලිත හෝ ආශ්‍රිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් පිහිටුවීම ;

2.2 සම්පූර්ණ ව්‍යාපාරය හෝ එහි කොටසක් විකිණීම ;

2.3 මුදල් ව්‍යාපාරය, කුලී සින්නක්කර, කල්බදු මූල්‍යකරණ හෝ උකස් ව්‍යාපාරවලට සෘජුව අදාළ නොවන නව ව්‍යාපාර කටයුත්තක් ඇරඹීම ;

2.4 යම් ආයතනයක හෝ සමාගමක සම්පූර්ණ ව්‍යාපාර කටයුතු හෝ ඉන් කොටසක් අත්පත් කර ගැනීම ;

2.5 යම් ආයතනයක් හෝ සමාගමක් සමඟ සංසර්ජනය කිරීම, බද්ධ කිරීම හෝ ඒකාබද්ධ වීම ;

2.6 සමාගමේ නම වෙනස් කිරීම ;

2.7 සමාගමේ කළමනාකාරිත්වය ප්‍රතිව්‍යුහගත කිරීම ;
නොකළ යුතුය.

අධ්‍යක්ෂගේ අනුමැතිය අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම්.

3. බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසිදු මුදල් සමාගමක් අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව ;

3.1 තැපල් සේවා, පණිවිඩ සේවා, ආහාරපාන පහසුකම් සේවා, ගෘහ පාලන හා පිරිසිදු කිරීමේ සේවා, පරිශ්‍ර ආරක්ෂා කිරීමේ සේවා, වැටුප් හා ලේඛක කටයුතු හැර වෙනත් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීම ;

3.2 සමාගමේ කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීම හෝ අඩු කිරීම ;

3.3 සමාගමේ පාලිත හෝ ආශ්‍රිත සමාගමක කොටස් ප්‍රාග්ධනයෙහි කර ඇති ආයෝජනයන් වැඩි කිරීම ;

3.4 පාලිත හෝ ආශ්‍රිත සමාගමක සම්පූර්ණ ව්‍යාපාර කටයුතු හෝ ඉන් කොටසක් විකිණීම ;

3.5 එහි සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම ;

3.6 පොත් අගය රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩි වත්කම්, පවත්නා වෙළඳපොල වටිනාකමට වඩා අඩු අගයකට පැවරීම හෝ විකිණීම ;

3.7 අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුර වෙනස් කිරීම; නොකළ යුතුය.

වත්කම් පැවරීම/ විකිණීම සම්බන්ධ සීමාව.

4. කිසිදු මුදල් සමාගමක් පවරන්නාට වාසි වන පරිදි ලැබෙන මූල්‍ය ප්‍රතිශ්ඨාවකට හැර වෙනත් ප්‍රතිශ්ඨාවකට එහි වත්කම් පැවරීම හෝ විකිණීම නොකළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරින්ගේ ඉල්ලා අස්වීම්.

5. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියා, අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව සමාගමෙන් ඉල්ලා අස් නොවිය යුතුය.

අර්ථ දැක්වීම.

6. මෙම විධානයෙහි,

6.1 "මුදල් ව්‍යාපාර", "පාලිත සමාගම" සහ "ආශ්‍රිත සමාගම" සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වගන්තියේ සඳහන් නිර්වචනයන්ට සමාන අර්ථ දිය යුතුය ;

6.2 "පවත්නා වෙළඳපොල වටිනාකම" යන්නෙන් කැමැත්තක් ඇති ගැණුම්කාර හා විකුණුම්කාර පාර්ශවයන් අතර අතේ දුරින් සිදුවන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු විය යුතු අගය ලෙස බලපත්‍ර ලත් තක්සේරුකරුවකු විසින් තීරණය කරනු ලබන තක්සේරු වටිනාකම අදහස් වේ ;

6.3 "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අදහස් වේ.

විධානයන් අහෝසි කිරීම.

7. 2005 අංක 5 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය සහ 1991 අංක 4 දරන මුදල් සමාගම් (වත්කම් මාරු කිරීම) විධානය මෙයින් අහෝසි කෙරේ.

07 - 624

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.